# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2344/22 - 2023 අගෝස්තු මස 09 වැනි බදාදා - 2023.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති යටතේ සාදන ලද නියමයන්

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය රොෂාන් රණසිංහ වන මම 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව මෝටර් රථ ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සංගමයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර තාවකාලික කාර්යක්‍රමයක් වශයෙන් එකී සංගමයේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පහත කමිටුව පත් කරමි.

| | | |
|---|---|---|
| 1. මහේෂ් ගම්මන්පිල මයා | - | සභාපති |
| 2. මේජර් ජනරාල් ඉඳුනිල් රණසිංහ මයා | - | ලේකම් |
| 3. පුබුදු වික්‍රම මයා | - | භාණ්ඩාගාරික |
| 4. රමීෂ් මාහමුර් මයා | - | සාමාජික |
| 5. නිශාන් වීරසූරිය මයා | - | සාමාජික |
| 6. චම්පිකා අමරසේකර මිය | - | සාමාජික |
| 7. සජාඩ් සුහායිර් මයා | - | සාමාජික |

තවද, ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා නිළවරණය පැවැත්වීම සඳහා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ වලංගු ක්‍රීඩා නියෝග අනුව එම සම්මේලනයෙහි විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා එමඟින් නිළවරණ කමිටුවක් පත් කිරීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මඟින් සිදු කිරීමටත් නිළවරණ කමිටුව මඟින් නිළවරණය කැඳවීම හා පැවැත්වීම අධ්‍යක්ෂ ජනරාල් වන ආචාර්ය ෂේමාල් ප්‍රනාන්දු මහතාගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමටත් බලය පවරමි.

**රොෂාන් රණසිංහ** (පා. ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ දී ය.

EOG - 08-0093


1A - G 40076 — 07 (2023/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*